# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**8 ශ්‍රේණිය**

**ඉතිහාසය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

### I කොටස

- **අංක 01 - 20 දක්වා ප්‍රශ්නවල වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) දිවයිනේ මහ වැව් ඉදිකිරීමේ පුරෝගාමියා ලෙස ගෞරවාදරුයට පාත්‍ර වූ රජතුමා කවුද?
   1) දුටුගැමුණු රජු ය  2) වසභ රජු ය
   3) ධාතුසේන රජු ය  4) මහසෙන් රජු ය

02) රජරට ප්‍රදේශයේ වියළි දේශගුණය සිසිල්ව තබා ගැනීමට නිර්මාණය කර ඇත්තේ මින් කුමක්ද?
   1) පිළිමගෙවල්  2) පොකුණු  3) බෝධිඝර  4) දනශාලා

03) පෘථිවිය ගෝලාකාර බවත්, සූර්යයා වටා ගමන් කරන බවත් ප්‍රකාශ කළ විද්‍යාඥයා වන්නේ
   1) නික්ලස් කොපර්නිකස් ය  2) ජොහැන්නස් කෙප්ලර් ය
   3) ගැලීලියෝ ගැලීලි ය  4) මයිකල් සර්ටෙස් ය

04) බෝධිය වටා ගෘහයක් තැනවීමේ ප්‍රධාන අරමුණ වන්නේ
   1) බෝධිය හොඳින් වැඩීම පහසු කරවීමට ය
   2) බෝධිය පිටට නොපෙනීමට කටයුතු කිරීමට ය
   3) බෝධියට ආරක්ෂාව සැපයීමට ය
   4) අධික අව් රශ්මියෙන් බෝධිය බේරා ගැනීමට ය

05) පණ්ඩුකාභය රජුගේ කාලයේ ඉදිකළ වැවක් වන්නේ මින් කුමක්ද?
   1) තිසා වැව  2) හුරුළු වැව
   3) අභය වැව  4) මහකනදරා වැව

06) වැවක ජලය මනා පාලනයකින් පිටතට ගැනීම සඳහා සකස් කරන ලද නිර්මාණය කුමක්ද?
   1) ගොඩ සොරොච්ච  2) මඩ සොරොච්ච
   3) පිටවාන  4) බිසෝකොටුව

07) රන් භාණ්ඩ රාශියක් නිරමාණය කළ බවට සාධක පෙන්වන රන් කර්මාන්තශාලාවක නටබුන් හමු වී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?
   1) ජේතවන විහාර භූමියෙනි  2) අභයගිරි විහාර භූමියෙනි
   3) රුවන්වැලි සෑ භූමියෙනි  4) පොළොන්නරුවේ ආලහන පිරිවෙනින් ය

08) මහනුවර රාජධානිය ආරම්භ කරන ලද්දේ කුමන රජතුමා විසින් ද?
   1) පළමුවන රාජසිංහ රජු  2) කරලියැද්දේ බණ්ඩාර රජු
   3) පළමුවන විමලධර්මසූරිය රජු  4) සේනාසම්මත වික්‍රමබාහු රජු

09) යුරෝපයේ පුනරුදය ආරම්භ වූ රට කුමක්ද?
   1) ඉතාලිය  2) රෝමය  3) ග්‍රීසිය  4) ප්‍රංශය

10) ✶උඩරට අලුත් රජ පෙළපතක් ආරම්භ කිරීම.

✶දෙල්ගමුව විහාරයේ සඟවා තිබූ දළදාව උඩරටට වැඩම කරවීම.

ඉහත කරුණු හා සම්බන්ධ රජතුමා වන්නේ,

1) පළමුවන විමලධර්මසූරිය රජු
2) දෙවන විමලධර්මසූරිය රජු
3) පළමුවන රජසිංහ රජු
4) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

11) පුනරුද සමයේ බිහිවූ වෙළඳ නගරයක් නොවන්නේ මින් කුමක්ද?

1) වැනීසිය
2) ජිනෝවා
3) ප්ලෝරන්ස්
4) පාදුවා

12) පැරණි ගඩොල්වල ශක්තිමත්භාවය නොඉක්මවා යන ප්‍රමිතියෙන් යුතුව ගඩොල් නිෂ්පාදනය කර මැතකදී සංරක්ෂණය කළ දගැබ මින් කුමක්ද?

1) අභයගිරි දගැබ
2) ථූපාරාම දගැබ
3) රුවන්වැලි සෑ දගැබ
4) ජේතවන දගැබ

13) කලාත්මක ලී කැටයම් නිර්මාණ දක්නට ලැබෙන ස්ථානයක් වන්නේ

1) මැදවෙල ටැම්පිට විහාරය
2) ලංකාතිලක විහාරය
3) ඇම්බැක්කේ දේවාලය
4) ගඩලාදෙණිය විහාරය

14) මෙරට ඇළ මාර්ග තාක්ෂණය පිළිබඳ "ලක්දිව පුරාතන වාරිමාර්ග" යනුවෙන් ප්‍රශස්ත කෘතියක් රචනා කළ ලේඛකයා කවුද?

1) එච්. සී. පී. බෙල් මහතා
2) ජෝන් කැල්වින් මහතා
3) ආර්. එල්. බ්‍රොහියර් මහතා
4) සෙනරත් පරණවිතාන මහතා

15) ක්‍රි. පූ. 3 වන සියවසේ පමණ සිට වියළි කලාපයේ ජනාවාස ව්‍යාපාරය ක්‍රමයෙන් වේගවත් වීම නිසා එකල වැසියන් මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වූයේ කුමක්ද?

1) පරිභෝජනයට අවශ්‍ය ජලය රැස්කර තබා ගැනීම
2) ජනගහනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
3) වී වගාවට අවශ්‍ය ප්‍රදේශ තෝරා ගැනීම
4) ජනාවාස පිහිටුවීමට සාරවත් ප්‍රදේශ තෝරා ගැනීම

16) දගැබක සෞන්දර්යාත්මක අගය වැඩි දියුණු කිරීම සඳහා දගැබ් ආශ්‍රිතව සතර දිශාවට මුහුණ ලා සැදූ නිර්මාණය වන්නේ

1) වාහල්කඩ
2) චෛතියඝරය
3) බෝධිඝරය
4) වටදගෙයයි

17) මහනුවර රාජධානියට ඇතුළුවීමට හැකි වූ දුර්ග මාර්ග දෙක සඳහන් පිළිතුර තෝරන්න.

1) ගල්ගෙදර, පිළිමතලාව
2) බලන, පේරාදෙණිය
3) හන්තාන, උඩවත්ත
4) බලන, හුන්නස්ගිරිය

18) ස්ථාවර වේල්ලක් සහිත පුරාණ අරමුණකට හොඳම නිදසුන වන්නේ

1) ඇළහැර අමුණ
2) තේක්කම් අමුණ
3) මිනිපේ අමුණ
4) හත්තොට අමුණ

19) පෘතුගීසීන් අන්ත පරාජයට පත් වූ ගන්නෝරුව සටන මෙහෙය වූ පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා කවුරුන්ද?

1) පේරෝලෝපෙස් ද සූසා
2) පෙරනිමෝද අස්වේදු
3) දියෝගෝ ද මේලෝ
4) කොන්ස්තන්තිනු ද සා

20) "අ" තීරුව සමඟ "ආ" තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. අන්තිම රාත්‍රී භෝජනය | A- ගැලීලියෝ ගැලීලි |
| 2. අවසාන විනිශ්චය | B- මයිකල් ආන්ජිලෝ |
| 3. ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව | C- ඩොනටෙලෝ |
| 4. දුරේක්ෂය නිපදවීම | D- ලියනාඩෝ ඩාවින්චි |

1) A B C D  2) D B A C  3) B D C A  4) D B C A

(ලකුණු 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01) පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. A රූපය



i. A රූපයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක්ද?
ii. මෙය කුමන ආගමක් හා සම්බන්ධ ද?
iii. මෙය දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ කුමන ඓතිහාසික නගරයෙන් ද?
iv. මෙහි දක්නට ලැබෙන වාස්තු විද්‍යාත්මක ශෛලිය කුමක්ද?

ii. B රූපය



i. B රූප සටහනේ දැක්වෙන චිත්‍රය කුමක්ද?
ii. මෙම නිර්මාණය කළ පුද්ගලයා කවුරුන්ද?
iii. එම පුද්ගලයා කුමන ජාතිකයෙක් ද?
iv. ඉහත නිර්මාණය කළ පුද්ගලයාගේ වෙනත් නිර්මාණයක් නම් කරන්න.

(ලකුණු 2x8=16)

02)
i. වියළි කලාපයේ තනවා ඇති වැව් දෙකක් නම් කරන්න. (ල 2)
ii. විශාල වැව් තැනවීම නිසා ලාංකිකයා ලබා ඇති ජයග්‍රහණ දෙකක් ලියන්න. (ල 4)
iii. වැවක ප්‍රධාන අංග 3ක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

03)
i. උඩරට රාජධානිය හැඳින්වීමට භාවිතා කළ වෙනත් නම් දෙකක් ලියන්න. (ල 2)
ii. පහත සඳහන් පුද්ගලයන්ගේ බෞතීස්ම නාමයන් ලියන්න. (ල 4)
   a) කුසුමාසන දේවිය
   b) කොනප්පු බණ්ඩාර
iii. මහනුවර රාජධානි සමයේ පැවති ආර්ථික රටාව පිළිබඳ කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 5)

04)

i. පැරණි චිත්‍ර කලාව පිළිබඳ තොරතුරු ලැබෙන ස්ථාන දෙකක් නම් කරන්න. (ල 2)

ii. අතීත ගෘහ නිර්මාණ අතර දැකිය හැකි ආගමික ගොඩනැගිලි දෙකක් හා ආගමික නොවන ගොඩනැගිලි දෙකක් නම් කරන්න. (ල 4)

iii. අපේ රටේ පැරණි ජල උද්‍යානවල කැපී පෙනෙන ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

05)

i. 15 වන සියවසේ යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල 2)

ii. මධ්‍යතන යුගයේ අවසානයේ බිහිවූ විශ්ව විද්‍යාල දෙකක් ලියන්න. (ල 4)

iii. යුරෝපයේ පුනරුද සමයේ කලා ශිල්පවල දැකිය හැකි ලක්ෂණ තුනක් හා පුනරුදයට පෙර කලා ශිල්පවල පැවති ලක්ෂණ දෙකක් වෙන වෙනම ලියන්න. (ල 5)

06)

i. පහත සඳහන් රජවරු විසින් කර වූ වාරි නිර්මාණය බැගින් ලියා දක්වන්න. (ල 2)
   a) මහසෙන් රජු
   b) ධාතුසේන රජු

ii. ඇළ මාර්ග තැනවීමේ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. (ල 4)

iii. විශාල වැව් තැනවීමේ දී ශ්‍රී ලාංකිකයන් මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කොට ඒවා ජය ගැනීමට කටයුතු කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 5)

07)

i. රජරට ශිෂ්ටාචාර සමයේ පිළිම ගෙවල් නිර්මාණය කළ සම්ප්‍රදායන් දෙකක් නම් කරන්න. (ල 2)

ii. පහත සඳහන් ඓතිහාසික ගොඩනැගිලි ඉදිකළ රජවරු කවුරුන්දැයි පිළිවෙළින් ලියන්න. (ල 4)
   a) රන්කොත් වෙහෙර
   b) ජේතවනය
   c) පොළොන්නරුවේ කිරිවෙහෙර
   d) මිරිසවැටිය

iii. කැටයම් හා මූර්ති කලාව පිළිබඳ අතීත ශිල්පීන් තුළ තිබූ නිපුණත්වය උදහරණ එක බැගින් දක්වා පැහැදිලි කරන්න. (ල 5)